**ශීර්ෂය - 258  මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**

------------------------------------------------------

1. **මූල්‍ය ප්‍රකාශන**

---------------

1.1 **තත්ත්වාගණනය කළ මතය**

------------------------------

මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව මහනුවර දිස්ත්‍රික් ලේකම් කර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2021 මැයි 21 වන දින ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදි. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 මැයි 21 දින ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

------------------------------------------

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකිම**

----------------------------------------------------------------------------------------------------

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍යා ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී. .

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) මෙම වාර්තාවේ 1.6.2 (අ) ඡේදයේ ඇතුලත් නිරීක්ෂණ සම්බන්ධයෙන් පසුගිය වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මත ඉදිරිපත් කරන ලද මාගේ වාර්තාවෙන් පෙන්වා දෙන ලද නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය ප්‍රකාශන චක්‍රලේඛ විධිවිධාවලට අනුකූල නොවීම

රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ මාර්ගෝපදේශ අංක 06 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුව තිබුණත්, එම අවශ්‍යතාවයන්ගෙන් බැහැර වූ අවස්ථා පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| භාණ්ඩාගාර පොත් හා දෙපාර්තමේන්තු පොත් අතර වෙනස සැසඳීම සඳහා අක්මුදල් ගැලැපුම් ගිණුමට තැන්පත්, අත්තිකාරම් හා වෙනත් අමාත්‍යාංශ දෙපාර්තමේන්තු වෙනුවෙන් දරන ලද එකතුව රු. 45,189,298 ක වටිනාකම අඩුවෙන් ගලපා තිබුණි. | විගණනය විසින් අනාවරණය කරගෙන ඇති කරුණු අක්මුදල් ගිණුමට ගලපා නොමැති බව පිළිගන්නා අතර ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිමේදි ශේෂ පිරික්සුම යෙදා ගන්නා බවත්,සංශෝධිත ගැලැපුම් ගිණුමක් මේ සමඟ ඉදිරිපත් කර ඇති බව. | වෙනස්කම් හඳුනාගෙන අක්මුදල් ගැලැපුම් ගිණුමට ගැලැපීම් සිදු කළ යුතු වීම. |

## 1.6.2 මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | දේපල පිරියත හා උපකරණ ශේෂය භාණ්ඩාගාර පොත් අනුව රු.7,577,381,360 ක් වුවත් මූල්‍ය නොවන වත්කම් (ACA – 6) පිළිබඳ ප්‍රකාශනයේ රු.6,535,339,049 ක් වීමෙන් රු.1,042,042,311 ක වෙනසක් පැවතුනි. | කුණ්ඩසාලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඉඩම්, ගොඩනැගිලි, හා යන්ත්‍රෝපකරණ ශේෂය රු.1,042,093,311 කින් එනම් තුන්ගුණයකින් වැඩිවී Web Interface වෙතින් පෙන්නුම් කිරීම නිසාත්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ පාතහේවාහැට හා මිනිපේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල යන්ත්‍රෝපකරණ ශේෂය රු.51,000 කින් අඩුවෙන් පෙන්නුම් කිරීම නිසාත් මෙම වෙනස්කම සිදු වී ඇති බව. | ඒසීඒ - 6 මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයෙහි ශේෂයන් භාණ්ඩාගාර පොත් ශේෂයන් සමඟ සැසඳිය යුතු වීම. |
| (ආ) | (ACA – 6) මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයෙහි ආරම්භක ශේෂයන් සමාලෝචිත වර්ෂයේ භාණ්ඩාගාර වත්කම් වාර්තාවේ ආරම්භක ශේෂයන් සමඟ සැසඳීමේදී වත්කම් අයිතම 10 ක වටිනාකම රු.4,157,647,226 ක් වැඩියෙන් භාණ්ඩාගාර වත්කම් වාර්තාවේ දක්වා තිබුණි. ඒ පිළිබඳව මූල්‍ය ප්‍රකාශන තුළ හෙළිදරව් කිරීමක් සිදුකර නොතිබුණි. | භාණ්ඩාගාර වාර්තාවේ 2020.01.01 දිනට ශේෂය හා 2019.12.31 දිනට මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශනයේ වත්කම්වල වටිනාකම අතර වෙනස මූල්‍ය ප්‍රකාශනය තුළ වෙනම හෙළිදරව් කළ යුතුව තිබුණු බව පිළිගන්නා බවත්, කාර්යාල 21 ම පාහේ 2019.12.31 දිනට තක්සේරු කර ගිණුම් ගත කිරීමට නොහැකි වූ මූල්‍ය නොවන වත්කම් 2020 වර්ෂයේදී තක්සේරු කර ගිණුම් ගත කරන ලද බවත් මෙම වටිනාකම් මූල්‍ය ප්‍රකාශනයේ අත්පත් කර ගැනීම් යටතේ සඳහන් කර ඇති බව. | -එම- |
| (ඇ) | සමාලෝචිත වර්ෂයට අදාළ මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ වර්ෂය තුළ සිදු කරන ලද අපහරණ වටිනාකම භාණ්ඩාගාර වත්කම් වාර්තාවේ අවසන් ශේෂයන් සමඟ සැසඳීමේ දී ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක වත්කම් අයිතම 5 ක රු.75,231,930 ක් වැඩියෙන්ද ප්‍රාදේශීය ලේකම් කාර්යාල 2ක වත්කම් අයිතම දෙකක රු.69,067 ක වටිනාකමක් අඩුවෙන් ද භාණ්ඩාගාර වත්කම් වාර්තාවේ දක්වා තිබුණි. | කුණ්ඩසාලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ අයිතම 5ක රු.25,077,310 ක අපහරණ වටිනාකම තුන්ගුණයකින් වැඩිවී Web Interface වෙතින් පෙන්නුම් කිරීම නිසාත් කෘෂිකාර්මික වාහන යටතේ උඩදුම්බර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ආරම්භක ශේෂය රු.46,050 ක් අඩුවෙන් පෙන්නුම් කිරිම නිසාත් මැදදුම්බර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ගෘහභාණ්ඩ අපහරණය රු.23,018 කින් අඩුවෙන් පෙන්නුම් කිරිමත් නිසාත් මෙම වෙනස්කම සිදු වී ඇති බව. | -එම- |

| | | | |
|---|---|---|---|
| (ඇ) | මිනිස් බල හා රැකි රක්ෂා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ 2019 අප්‍රේල් 25 දිනැති අංක DOME/02/05-14 දරන ලිපිය අනුව දිස්ත්‍රික් ලේකම් වෙත පවරා තිබූ රු.67,420 ක් වටිනා කාර්යාල උපකරණ, විද්‍යුත් උපකරණ හා පරිගණක උපාංග වල වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි. | මෙම වත්කම් 2021 වර්ෂයේදී ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව. | ආයතනයට පවරා ඇති සියලු ජංගම නොවන වත්කම්වල පිරිවැය හෝ තක්සේරු අගය ගිණුම්ගත කළ යුතු වීම. |

**1.6.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

----------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ආයතනය විසින් ඉදිරිපත් කරන ලද ඒකාබද්ධ ශේෂ පිරික්සුම අනුව වෙනත් වැය ශීර්ෂයන් වෙනුවෙන් දරන ලද රු.5,801,485,055 ක ශුද්ධ වියදම, මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ රු.5,790,464,470 ක් ලෙස දක්වා තිබුණි. මේ සඳහා විශ්‍රාම වැටුප් ශීර්ෂයෙන් ගෙවන ලද රු.11,020,585 ක වටිනාකම අත් හැරීම හේතු වී තිබුණි. | විගණනයෙන් පෙන්වා දී ඇති පරිදි වියදම්, ශේෂ පිරික්සුමෙන් උපුටා නොගෙන වියදම් වාර්තාවලින් ලබා ගැනීමේ හේතුව මත මෙම අත්හැරීම් දෝෂය සිදු වී ඇති බවත් ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ශේෂ පිරික්සුම පදනම් කර ගැනීමට කටයුතු කරන බව . | වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු විසින් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙනුවෙන් දරන ලද ශුද්ධ වියදම මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ ඇතුළත් කළ යුතු වීම. |
| (ආ) | දෙපාර්තමේන්තු පොත් අනුව අත්තිකාරම් ලැබීම් හා ගෙවීම් පිළිවෙලින් රු.117,490,677 ක් හා රු.101,836,253 ක් වුවත් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ අත්තිකාරම් ලැබීම් හා ගෙවීම් පිළිවෙලින් රු.72,305,129 ක් හා රු.67,695,292 ක් ලෙස දක්වා තිබුණි. ඒ අනුව අත්තිකාරම් ලැබීම් හා ගෙවීම් අතර පිළිවෙලින් රු.45,185,548 ක හා රු.25,531,124 ක වෙනසක් පැවතුණි. | භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහන් සහ වියදම් වාර්තා පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම නිසා වෙනස ඇති වී ඇති බවත්, ඉදිරි වර්ෂයේ ගිණුම් පිළියෙල කිරීම ශේෂ පිරික්සුම පදනම් කරගෙන සිදු කරන බව. | ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ලෙස මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දක්වා ඇති අත්තිකාරම් ලැබීම්, ගෙවීම් වටිනාකම් දෙපාර්තමේන්තුවේ ඒකාබද්ධ ශේෂ පිරික්සුමේ අගයන් සමඟ සමාන විය යුතු වීම |

| | | | |
|---|---|---|---|
| (ඇ) | දෙපාර්තමේන්තු පොත් අනුව තැන්පත් ලැබීම් හා ගෙවීම් පිළිවෙළින් රු.855,364,694 ක් හා රු.1,086,836,756 ක් වුවද මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මූල්‍ය ක්‍රියාකාරකම් යටතේ පිළිවෙලින් රු.855,360,944 ක් හා රු.1,086,809,005 ක් ලෙස තැන්පතු ලැබීම් රු.3,750 ක් හා තැන්පත් ගෙවීම් රු.27,751 ක් අඩුවෙන් දක්වා තිබුණි. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහන් ඇසුරෙන් සිදුකිරීම කිරීම නිසා තැන්පතු අඩුවී ඇති බවත්, ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම ශේෂ පිරික්සුම පදනම් කරගෙන සිදුකරන බව | මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය යටතේ ඇති අගයන් දෙපාර්තමේන්තු ඒකාබද්ධ ශේෂ පිරික්සුමේ අගයන් සමඟ සමාන විය යුතු වීම. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2019/2020 මහ කන්නයේ හා 2020 යල කන්නය සඳහා වී මිලදී ගැනීමට වී අලෙවි මණ්ඩලය මගින් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත අවස්ථා දෙකකදී ලබාදී තිබූ රු.මිලියන 21 ක සම්පූර්ණ ප්‍රතිපාදන මුදලම, පැහැදිලි කළ ක්‍රමවේදයන් මත සුළු හා මධ්‍ය පරිමාණ සහල් මෝල් හිමියන් ඉදිරිපත් නොවීම හේතුවෙන් ආපසු යවා තිබුණි. | 2019/2020 මහ කන්නයේ සහ 2020 යල කන්නයේ වී මිලදී ගැනීමට ආහාර දෙපාර්තමේන්තුවෙන් ලබාදුන් අරමුදල් උපයෝගී කොටගෙන සුළු හා මධ්‍ය පරිමාණ සහල් මෝල් හිමියන් දැනුවත් කර වී අස්වනු මිලදී ගැනීමට විධිවිධාන යෙදුවද මෝල් හිමියන් ඉදිරිපත් නොවූ නිසා මුදල් ආපසු යැවීමට සිදු වූ බව. | ජනාධිපති ලේකම්ගේ 2020 ජනවාරි 24 දිනැති අංක PS/EPC/06/2020 දරන චක්‍රලේඛයේ නිර්දේශ අනුව කටයුතු කළ යුතුවීම. |

## 2.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **නීති,රීති හා රෙගුලාසිවලට යොමුව** | **අනුකූල නොවීම** | | |
| (අ) **ව්‍යවස්ථාපිත විධිවිධාන** | | | |
| 1968 අංක 32 දරන පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ පනත හා 2016 අංක 08 දරන පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනතේ 5.2 වගන්තිය | නියැදි පරීක්ෂාවේදී ප්‍රාදේශීය ලේකම් කාර්යාල 12ක 2020 දෙසැම්බර් 31 දින වන විට වසම් 542 ක අවුරුදු 21 ඉක්ම වූ පුද්ගලයන් 3,964 දෙනෙකු හැඳුනුම්පත් ලබාගෙන නොතිබුණි. | උප්පැන්න සහතිකය හෝ සිය උපන්දිනය සනාථ කළහැකි කිසිඳු ලියවිල්ලක් නොමැති වීම, ආබාධිත සහිත පුද්ගලයන් වීම හා ලේඛන සොයාගැනීමේ අපහසුව, ඇතැම් පුද්ගලයන් තම උපන් දිනය, උපන් ස්ථානය, දෙමාපියන්, හා සහෝදර සහෝදරියන් පිළිබඳ කිසිඳු තොරතුරක් ඉදිරිපත්කර ගැනීමට නොහැකි වීම යන හේතු මත අදාළ තත්ත්වය මතු වී ඇතිබව පස්බාගේ කෝරළේ හා දොළුව ප්‍රාදේශීය ලේකම්වරු වාර්තා කර ඇති අතර ඉතිරි ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල තොරතුරු කැඳවීම පමණක් සිදුකරන ලද බව. | පනතේ විධිවිධාන අනුව කටයුතු කළ යුතු වීම. |

**(ආ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ**
**--------------------------**

| | | | | |
|---|---|---|---|---|
| i. | 2013 ජූලි 08 දිනැති අංක HAF-3-ADMIN-02-002 දරන ලිපියේ 4 ඡේදය | ප්‍රාදේශිය ලේකම් කාර්යාල 03 ක ග්‍රාම නිලධාරී වසම් 213 ක මාස 2 සිට මාස 12 ක කාලයක් සඳහා අනවසර අල්ලා ගැනීම් පිළිබඳ දෙසති වාර්තා ග්‍රාම නිලධාරීන් විසින් ඉදිරිපත් කර නොතිබුණි. | නියමිත දිනට ඉදිරිපත් කරන ලෙසට සියලුම නිලධාරින් නැවතත් දැනුවත් කරන ලද බව හා මේ සම්බන්ධයෙන් සහකාර ප්‍රාදේශීය ලේකම්ගේ පෞද්ගලික අධීක්ෂණයට යොමුවන පරිදි ක්‍රමවේදයක් සකස් කරනලද බව. | චක්‍රලේඛ විධිවිධාන වලට අනුව කටයුතු කළ යුතු වීම. |
| ii. | 2019 මැයි 31 දිනැති අංක 14/2019 දරන චක්‍රලේඛය | සිදූ කළ නියැදි පරීක්ෂාවට අනුව සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් පාතදුම්බර හා උඩුනුවර ප්‍රාදේශීය ලේකම් කාර්යාල 02 ක විශ්‍රාම වැටුප්ලාභීන් 74 දෙනකුගේ විශ්‍රාම වැටුප් සඳහා 2019 අයවැය යෝජනා අනුව සිදු කළ යුතු සංශෝධනයන් අවසන් කර නොතිබුණි. | ප්‍රමාණවත් තොරතුරු ගොනුව තුළ නොමැතිවීම හේතුවී ඇති බව පාතදුම්බර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වාර්තා කර ඇති බවත් , තොරතුරු ලබාගැනීමට අදාළ ආයතන හා විශ්‍රාමිකයන්ගෙන් විමසීම් සිදුකර ලිපියොමු කර ඇති බවත්, එම ගොනු සම්බන්ධයෙන් උපදෙස් ඉල්ලා උඩුනුවර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2021/4/08 දින විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් වෙත ලිපියක් යොමු කර ඇති බවත්. | -එම- |

(ඇ) **රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ**
**------------------------**

| | | | |
|---|---|---|---|
| 2001 දෙසැම්බර් 20 දිනැති අංක 13/2001 දරන චක්‍රලේඛය | පාතදුම්බර ප්‍රාදේශිය ලේකම් කාර්යාලය විශ්‍රාම වැටුප් ලිපිගොනු 31 කට අදාළ කටයුතු සමාලෝචිත වර්ෂය අවසන් වනතෙක් සිදුකර නොතිබුණි. | වි.වැ.අධ්‍යක්ෂ ජනරාල්ගේ 2020.10.05 දිනැති ලිපියෙන් මෙම කාර්යාලයෙන් යැවූ ගොනු 31 නැවත සකස් කර එවන ලෙස දැනුම් දී ඇත. අදාල කාල වකවානුව තුල වි.වැ. දෙපාර්තමේන්තුව මහජන කාර්යන් සඳහා විවෘත නොකළ බැවින් සහ තැපැල් දෙපාර්තමේන්තුවේ කටයුතු නවතා තිබූ බැවින් | -එම- |

| | | |
|---|---|---|
| | | 2021.02.15 හා 16 යන දිනවල ගොනු යැවීමට කටයුතු කර ඇති බවත් 2021.05.06 වන දින නැවත විමසීමක් කර ඇති බව. |

**2.3 අත්තිකාරම් නිකුත් කිරීම හා පියවීම**

**රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසැඳුම් ප්‍රකාශය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වැඩතහනම් කළ නිලධාරියෙකුගෙන් රු.136,620 ක ණය ශේෂයක් හා සේවය අතහැරගිය නිලධාරියෙකුගෙන් රු.106,391 ක ණය ශේෂයක් වර්ෂ 7 ක කාලයක සිට 2020 දෙසැම්බර් 31 දින වනවිටත් අයවිය යුතුව පැවතුනි. | වැඩතහනම්කළ රු. 136,620 ක ණය ශේෂය අයකර ගැනීමට ආරම්භ කළ විනය පරීක්ෂණ කටයුතු කඩිනම් කිරීමට පියවර ගන්නා බවත් රු.106,391 ක ණය මුදල ගෙවා නිරවුල් කරන ලෙසත් නීතිපතිවරයා දන්වා තිබුණ ද ණය මුදල පියවීම සිදු කර නොමැති බව. | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ **xxiv** පරිච්ඡේදයේ 4 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

**2.4 තැන්පත් ශේෂයන්**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රාදේශිය ලේකම් කාර්යාල 04 ක වැඩ අවසන් කරන ලද නඩත්තු කාලය අවසන් ව්‍යාපෘති 170 කට අදාළ එකතුව රු.9,579,089 ක් වූ අතරඳවුම් මුදල් නිරවුල් කිරීමට කටයුතු නොකර මාස 01 ත් අවු 01 ත් අතර කාල පරාසයක් පොදු තැන්පත් ගිණුමේ රඳවා තිබුණි. | පාතදුම්බර ව්‍යාපෘති දෙකකද උඩුනුවර ව්‍යාපෘති තුනකද හාරිස්පත්තුව ව්‍යාපෘති දෙකකද ද මේ වන විට රැඳවුම් මුදල් නිදහස් කර ඇති බව. | නඩත්තු කාලය අවසානයේ තාක්ෂණික නිලධාරී වාර්තාවක් ලබාගෙන රැඳවුම් මුදල් නිදහස් කිරීමට කටයුතු කළ යුතු වීම. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 සැලැසුම් කිරීම

රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ මාර්ගෝපදේශ 12 ප්‍රකාරව කාර්ය සාධනය සම්බන්ධ සැලැසුම් කිරිමට අදාළව අනාවරණය වු නිරීක්ෂණයන් පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමේ දී අනුමත අයවැය පදනම් කරගත් ප්‍රමුඛතාවය අනුව ක්‍රියාකාරකම් පෙළගැස්විය යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි | ඉදිරියේදී එම අවශ්‍යතා අවධානයට ගෙන අනුමත අයවැය පදනම් කරගෙන ක්‍රියාත්මක සැලස්ම පෙළගැස්වීමට කටයුතු කිරීමට පියවර ගන්නා බව. | ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමේ දී අනුමත අයවැය පදනම් කරගත් ප්‍රමුඛතාවය අනුව ක්‍රියාකාරකම් පෙළගැස්විය යුතු වීම. |
| (ආ) | සිදුකරන ලද නියැදි පරීක්ෂාවේදී ගිණුම්, සංවර්ධන, ඉඩම්, සමාජ සේවා(වැඩිහිටි), දිස්ත්‍රික් ඉඩම් පරිහරණ යන අංශයන් යටතේ 2020 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම තුළ යම් යම් ක්‍රියාකාරකම් දක්වා නොතිබුණද කාර්යසාධන වාර්තාව තුළ එම ක්‍රියාකාරකම් යටතේ ප්‍රගතීන් දක්වා තිබුණි. | 2020 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම තුළ ඇතුළත් යම් යම් ක්‍රියාකාරකම් සඳහා සැලැසුම් දක්වා නොතිබුණි. එහෙත් රජය මඟින් පවත්නා වර්ෂයේ විවිධ කාල පරාසයන් තුළ හා අවසන් කාර්තු තුළ යෝජිත ක්ෂණික විශේෂිත වු ක්‍රියාකාරකම් හා ව්‍යාපෘති සඳහා ප්‍රතිපාදන සැලසීමේදී එම ක්‍රියාකාරකම් සිදුකෙරෙන බැවින් එම ක්‍රියාකාරම් සඳහා සංශෝධිත ක්‍රියාත්මක සැලැස්මක් ඉදිරිපත් කිරීමට ප්‍රමාණවත් අවකාශයක් නොලැබුනත් විවිධ අංශ හා ආයතන මඟින් ඉටුකරනු ලබන ක්‍රියාකාරකම් වල ප්‍රගතිය කාර්යසාධන වාර්තාවේ අවසන් ප්‍රගතිය සඳහා ඇතුළත්කර ඇති බව | මාර්ගෝපදේශ 12 අනුව වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම පිළියෙල කළ යුතු වීම. |

## 3.2 කාර්යභාරයන් ඉටු නොකිරීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2017 ජනවාරි 12 දිනැති අංක MWGA/WB/ග්‍රා.කා.සැ/2017 දරන ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශ අධ්‍යක්ෂකගේ ලිපිය ප්‍රකාරව සෑම ග්‍රාම නිලධාරි වසමකටම කාන්තා කාර්ය සමාජ පිහිටුවා ලියාපදිංචි කිරීමට කටයුතු කළ යුතු විය. එහෙත් 2020 වර්ෂයේ උඩුනුවර,මැදදුම්බර හා උඩුදුම්බර ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03 ක ග්‍රාම නිලධාරී වසම් 280 කින් කාන්තා කාර්ය සමාජ 31 ක් ලියාපදිංචි කර නොතිබුණි. | උඩුනුවර,මැදදුම්බර, උඩුදුම්බර යන කොට්ඨාශ විගණන අවස්ථාවේ තිබූ තත්වයට වඩා සැළකිය යුතු ප්‍රගතියක් අත්කර ගෙන ඇති බව සහ කාන්තා සමිති ලියාපදිංචිය සඳහා අවශ්‍ය සාමාජික මුදල් හා බැංකු ගිණුම් විවෘත කිරීම සඳහා මුදල් එකතු කිරීම ඔවුන්ගේ දැඩි ආර්ථික දුෂ්කරතා හේතුවෙන් අතපසුවී ඇති බව. | චක්‍රලේඛ විධිවිධාන අනුව කටයුතු කළ යුතු වීම. |

## 3.3 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) සපිරිගමක් ජනතා සහභාගීත්ව සංවර්ධන වැඩසටහනට අදාළව නිකුත් කරන ලද මුදල් සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශ ලේකම්ගේ 2019 දෙසැම්බර් 06 දිනැති අංක 01/2019 දරන චක්‍රලේඛයේ 01 ඡේදය අනුව සංරචක 09 ක් යටතේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට හඳුන්වා දී තිබුණි. එහෙත් මහනුවර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 20 හි ක්‍රියාත්මක ව්‍යාපෘති 3795 කින් ව්‍යාපෘති 3670 ක් එනම් සියයට 97 ක් ග්‍රාමීය මාර්ග සංවර්ධනයට අදාළ ව්‍යාපෘති වූ බැවින් චක්‍රලේඛයේ සඳහන් පරිදි සාර්ව ආර්ථික ඉලක්ක වෙත ළඟාවීමේ ඉඩකඩ සීමිත වී තිබුණි. | සපිරිගමක් ජනතා සහභාගිත්ව සංවර්ධන වැඩසටහන යටතේ නිකුත් කර ඇති චක්‍රලේඛ ප්‍රකාරව විෂමතා අවම කරමින් රට සංවර්ධනය කිරීම අරමුණු කර ඇති අතර, ජනතා කේන්ද්‍රීය ආර්ථිකයක් බිහිකිරීම තුළින් සාර්ව ආර්ථික ඉලක්ක සපුරා ගැනීම මෙම වැඩසටහනෙහි අරමුණ විය. එබැවින් සංරචක 09 ක් යටතේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට හඳුන්වා දි තිබුණද එම ව්‍යාපෘති හඳුනා ගැනීමේදී ප්‍රදේශයේ ග්‍රාමීය කමිටු තුළින් කරන ලද ඉල්ලීම් හා යෝජනා කිසිදු රාජ්‍ය නිලධාරියෙකුගේ මැදිහත්වීමකින් තොරව | චක්‍රලේඛ විධිවිධාන අනුව අරමුණු සපුරා ගැනීමට කටයුතු කළ යුතු වීම. |

| | | |
|---|---|---|
| | ලබාගත් ඒවා විය. එමනිසා ඉහත චක්‍රලේඛ පරිදි සංරචක 09 ක් අතුරින් සංරචක 08 ක් අභිබවා ග්‍රාමීය මාර්ග සංවර්ධනය සඳහා යෝජනා ඉදිරිපත් වීම තුළ එම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට සිදුවූ බව පෙන්වා දී ඇති කරුණු සත්‍ය බව. | |
| (ආ) පස්බාගේ කෝරළය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අධි අවදානම් ඇති ප්‍රදේශවල ජීවත් වන පවුල් නැවත පදිංචි කිරීමේ ව්‍යාපෘතිය යටතේ හඳුනාගන්නා ලද පවුල් 53 අතුරින් 10 දෙනෙකු රජය විසින් ලබාදෙන රු.400,000 ක මුදලින් නැවත පදිංචිය සඳහා සුදුසු ඉඩම් කැබලි හඳුනාගැනීමට පවතින අපහසුතාවය සහ එම මුදලට අමතරව යම් වියදමක් කර ඉඩමක් මිලදී ගැනීමේ හැකියාව මෙම පවුල්වලට නොමැතිකම මත නැවත පදිංචියට සුදුසු ඉඩම් හඳුනාගැනීමට මෙතෙක් නොහැකිවී තිබුණි. | තවදුරටත් පවුල් 10 ක් සඳහා පමණක් නැවත පදිංචි සඳහා ඉඩම් හඳුනා ගත යුතුව පවතින බව. | අපේක්ෂිත අරමුණු ඉටුකිරීමට කටයුතු කළ යුතු වීම. |

**3.4 අපේක්ෂිත ප්‍රතිලාභ (Benefits) ලබා නොගැනීම**

---

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ගර්භනී සමයේ නිසි කලට නිසි පෝෂණය ලබාදීම සහ අඩුබර දරු උපත් ශ්‍රී ලංකාවෙන් තුරන් කිරීමේ අරමුණු පෙරදැරි කරගෙන කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක ගැබිණි මව්වරුන්ට ලබාදෙන රු.20,000 ක පෝෂණ දීමනා වැඩසටහන යටතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 20 හි 2020 දෙසැම්බර් 31 දින වන විට අවස්ථා 7102 කදී රු. 14,204,000 ක පෝෂණ දීමනා වටිනාකමක් ගැබිණි මවුවරුන් විසින් ලබාගෙන නොතිබුණි. | කොවිඩ් 19 රෝග තත්වය හේතුවෙන් හුදකලා කළ වසම්වල මව්වරුන්ට භාණ්ඩ ලබාගැනීමට නොහැකි වීම, වවුචර්පත් ලැබෙන සියලුම මව්වරුන් එම භාණ්ඩ ලබාගැනීමට ඉදිරිපත් නොවීම, ගබ්සාවන මව්වරුන් සම්බන්ධ තොරතුරු ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලට වාර්තා නොවීම, දරු ප්‍රසූතිය සඳහා ඇතැම් මව්වරුන් වෙනත් ස්ථානවලට යාම මෙම තත්වයට හේතු වී ඇති බව. | අපේක්ෂිත ප්‍රතිලාභ ලබා ගැනීමට කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | දිවිනැගුම දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක ජීවනෝපාය චක්‍රීය අරමුදල් ගිණුමේ 2020 දෙසැම්බර් 31 දින වන විට ශේෂය රු.169,488,100 ක් වූ අතර එයින් ණය ලබා දී පිටහිටි ශේෂය රු.99,517,949 ක් හා තවදුරටත් ලබාදිය හැකි ණය අරමුදල් ශේෂය රු.69,970,151 ක් විය. ඒ අනුව ප්‍රතිලාභින් සවිබල ගැන්වීමේ අරමුණින් සිදු කරන ණය ලබාදීමේ ක්‍රියාවලියේ සමස්ත ශේෂයෙන් සියයට 40 කට ආසන්න ප්‍රමාණයක් තවදුරටත් ණය ලබා දිය හැකි වුවද ඒ පිළිබඳව අවධානය යොමු කර නොතිබුණි. | 2020 වර්ෂය තුළ සාර්ථක ව්‍යවසායකයින් වෙත ජීවනෝපාය සංවර්ධන ණය නිකුත්කර තිබීම, චක්‍රීය ණය සාර්ථක ව්‍යාපෘති සඳහා පමණක් ක්‍රියාත්මක කිරීම, කොරෝනා වසංගත හමුවේ ව්‍යාපාර අඩපණ වීම මත ණය ඉල්ලුම් කිරීම අඩුවීම, ව්‍යවසායකයින් ණය ආපසු ගෙවීම දුර්වල මට්ටමක පැවතීම නිසා ණය නිකුත් කිරීම ගැටලුවක් වීම, ප්‍රජාමූල බැංකු සමිති මගින් ක්‍රියාත්මක සමස්ත ණය වැඩසටහන්වල අඩු ප්‍රගතිය මෙම ණය වැඩසටහන සඳහා ද බලපා තිබීම වැනි හේතූන් මේ සඳහා බලපා තිබුණද 2021 වර්ෂයේ දී මෙම චක්‍රීය අරමුදලෙන් ණය නිකුත් කිරීම සඳහා කටයුතු සිදුකරන බව බැංකු කළමණාකරුවන් විසින් දන්වා ඇති බව. | ප්‍රතිලාභීන්ට උපරිම සේවයක් ලැබෙන පරිදි චක්‍රීය ණය වැඩසටහන ක්‍රියාත්මක කළ යුතු විම. |
| (ඇ) | පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල බල ප්‍රදේශයේ ක්‍රියාත්මක කොරවක් ඔය ජල විදුලි බලාගාරය හා බහරන්ඩා ජල විදුලි බලාගාරය යන කුඩා ජල විදුලිබලාගාර 02 ක් ජලය ලබා ගැනීම සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ අවසරය ලබාගෙන නොතිබුණු අතර විදුලි බල නිෂ්පාදනය (මෙගා වොට් පැය ) මත අයකර ගත යුතු ජල හැරවුම් ගාස්තුව ව්‍යාපෘතිය ආරම්භයේ සිට අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මේ යටතේ දක්වා ඇති කුඩා ජල විදුලි ව්‍යාපෘති 02 ක්‍රියාත්මක වන ඉඩමේ හිමිකම සම්බන්ධයෙන් නඩු කටයුත්තක් විභාග වෙමින් පවතින බවත් එබැවින් ඉඩම අත්පත්කර ගැනීමේ කටයුතු සිදුකළ නොහැකි බවත්,එහෙත් බදු මුදල් අය කිරීම සඳහා අවශ්‍ය ලේඛන ආයතන වෙතින් ගෙන්වා ගැනීමට ද කටයුතු කරන බව. | ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුල ක්‍රියාත්මක කරන ව්‍යාපෘති සඳහා රජයේ අවසරය ලබා ගත යුතු වීම. |
| (ඈ) | උඩුදුම්බර ප්‍රාදේශිය ලේකම් බල ප්‍රදේශයේ රු.1,093,731 ක් වැයකර තලගුනේ කොටුවේ ලන්ද ග්‍රාමීය ජල යෝජනා ක්‍රමය යටතේ ළිඳ සකස් කිරීම, ජල පොම්පාගාරය සකස් කිරීම සිදු කර තිබුණද ජලය ලබා දීම සිදුකර නොතිබුණි. | ව්‍යාපෘතියේ **II** අදියර යටතේ පොම්පාගාරය නිම කිරීමට හා ක්‍රමවත්ව ප්‍රතිලාභීන් වෙත ජලය ලබාදීමට **2021** සංවර්ධන යෝජනා යටතේ යෝජනා ඉදිරිපත්කර ඇති බව . | ව්‍යාපෘතියෙන් අපේක්ෂිත ප්‍රතිලාභ ලබා ගැනීමට කටයුතු කළ යුතු වීම. |

## 3.5 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| හාරිස්පත්තුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලීය නව ගොඩනැගිල්ල සඳහා ශ්‍රී ලංකා රාජ්‍ය ජාල ව්‍යාපෘති පහසුකම (LGN 2.0) ලබා ගැනීමට අදාළව ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය (ICTA) හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලය අතර ගිවිසුම් අත්සන් කර තිබුණද , එම අවශ්‍යතාවය ඉටු කර ගැනීමට නොහැකි වී තිබීමෙන් ආයතනය තුළ පවතින දත්ත හුවමාරු වේගය අඩුවීම කාර්යාලීය වැඩ කටයුතු සඳහා බාධාවක්ව පැවතුණි. | මෙම කාර්යාලයේ නව ගොඩනැගිල්ල සඳහා LGN 2.0 සම්බන්ධතාවය ලබා ගැනීමට අදාළ අවබෝධතා ගිවිසුම අත්සන් කර ICTA ආයතනය වෙත යවා ඇතත්, ICTA ආයතනය හා ටෙලිකොම් ආයතනය අතර ගිවිසුම යාවත්කාලීන කර නොමැති බැවින්, නව සම්බන්ධතාවයන් ලබාදීමට නොහැකි බව දැනුම් දී ඇත. ඒ අනුව මෙතෙක් නව ගොඩනැගිල්ලට LGN 2.0 සම්බන්ධතාවය ලබාදීමට නොහැකිවී ඇති බව. | ව්‍යාපෘති කාලය තුළ සේවාව ඉටු කරගැනීමට කටයුතු කළ යුතු වීම. |

## 3.6 වෙනත් නිරීක්ෂණ

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) තුම්පනේ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ රු.4,000,000 ක ඇස්තමේන්තු ගත මුදලකට ඕපල්ල ග්‍රාම නිලධාරි වසමේ ජල යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කර තිබුණි. ජල ව්‍යාපෘතියේ ඉදිකිරීම් ස්ථානයේ ඉඩම ප්‍රාදේශිය ලේකම් නමින් විධිමත්ව ඔප්පුවක් මගින් පවරා ගැනීමට කටයුතු කර නොතිබූ අතර භෞතික පරීක්ෂාවේදී රු.775,161 ක වැඩ විෂයයන් 18 ක් ඉටු කර නොතිබුණි. | ජල ව්‍යාපෘතියේ ඉදිකිරීම් ස්ථානයේ ඉඩමේ අයිතිය ප්‍රාදේශීය සභාවට ඔප්පුවක් මගින් පැවරීමට අවශ්‍ය කටයුතු කරන ලෙස ලිඛිතව දන්වා ඇති අතර, මේ වන විට එය නීත්‍යානුකූලව පවරා ගැනීමට කටයුතු සිදු කරමින් පවතින බවත්, භෞතික පරික්ෂාවේ දී ඉටුකර නොතිබූ අයිතමයන් මේ වන විට ඉටුකර අවසන් අතර, ඊට අදාළ මුදල රැඳවුම් මුදලක් ලෙස තබාගෙන ප්‍රමාද ගාස්තු ද අයකර බිල් පතෙහි ඉතිරි වටිනාකම ඉදිරියේදී ගෙවීමට අවශ්‍ය කටයුතු කරමින් පවතින බව . | ව්‍යාපෘතිය ආරම්භ කිරීමට ප්‍රථම අදාළ ඉඩම නිසි පරිදි පවරා ගැනීමට කටයුතු කළ යුතු අතර ඉටු කරන ලද වැඩ විෂයන් සඳහා පමණක් ගෙවීම් කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | තුම්පනේ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ ගලබාව ළමා සායන මධ්‍යස්ථානය ඉදි කිරිම සඳහා රු.860,305 ක මුදලක් ගෙවිම් කර තිබුණ ද කාර්මික නිලධාරි විසින් සහතික කර තිබූ මිණුම් පත්‍රයන්ගේ නොකළ වැඩ විෂයන් 4ක් සඳහා එකතුව රු.48,950 ක් ගෙවිම් කර තිබුණි. | මෙම බිල්පත වර්ෂය අවසානයේ දෙසැම්බර් 29 දින අප වෙත ලැබුණු අතර, දෙසැම්බර් මස අවසන් සතිය තුළ දී බිල්පත් 75 ක් පමණ ප්‍රාදේශීය සභාවෙන් ලැබුණු බැවින් පරික්ෂා කිරීමේදී අතපසු වීමක් සිදු වී ඇති බවත්, මේ වන විට එම අඩුපාඩු සකස්කර ඇති අතර, එම බිල්පතෙහි සිදුවී තිබූ අඩුපාඩුව පියවා ගැනීම සඳහා එම මුදල රැඳවුම් මුදල්වලින් අඩුකර ගෙවීමට සභාව මගින් ප්‍රාදේශීය ලේකම් වෙත ඉදිරිපත් කර ඇති බවත්, මේ වන විට එසේ අඩුකර ගෙවීමට අවශ්‍ය කටයුතු සිදුකර ඇති බව. | ඉටුකළ වැඩ සඳහා පමණක් ගෙවීම් කළ යුතු වීම. |

**3.7 වාර්ෂික කාර්යසාධන වාර්තාව**

2020 අගෝස්තු 28 දිනැති අංක 2/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10.2 ඡේදය ප්‍රකාරව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන කළ මාර්ගෝපදේශ අංක 14 හි සඳහන් ආකෘතිය ප්‍රකාරව වාර්ෂික කාර්යසාධන වාර්තාව පිළියෙල කළ යුතුව තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්විම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | තිරසර සංවර්ධන අරමුණු සපුරා ගැනීමේ කාර්යසාධනය තොරතුරු කාර්යසාධන වාර්තාවට ඇතුළත් කර නොතිබුණි. | 2020 අගෝස්තු 28 දිනැති 02/2020 (i) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය අනුව ඉදිරියේදී කාර්යසාධන වාර්තාව සකස්කර ඉදිරිපත් කරන ලෙස නිලධාරින්ට උපදෙස් දෙන ලද බව . | චක්‍රලේඛ විධිවිධාන පරිදි කටයුතු කළයුතු වීම . |
| (ආ) | සිදුකරන ලද නියැදි පරීක්ෂාවේදී ගිණුම්, සංවර්ධන, ඉඩම්, සමෘද්ධි, ඉංජිනේරු, ජන හා සංඛ්‍යා ලේඛන, සමාජ සේවා, සමාජ සේවා (උපදේශන), සමාජ සේවා (වැඩිහිටි) යන අංශයන් යටතේ ක්‍රියාකාරී සැලැස්ම තුළ ඇතුළත් වැඩසටහන් 40 ක ප්‍රගතින් කාර්යසාධන වාර්තාව තුළ දක්වා නොතිබුණි. | 2020 අගෝස්තු 28 දිනැති 02/2020 (i) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය අනුව ඉදිරියේදී කාර්යය සාධන වාර්තාව සකස්කර ඉදිරිපත් කරන ලෙස නිලධාරින්ට උපදෙස් දෙන ලද බව . | 2020 වර්ෂය තුළදී ක්‍රියාත්මක කිරීමට සැලැසුම් කර ඇති සියලුම ක්‍රියාකාරකම්වලට අදාළ කාර්යසාධනයන් කාර්යසාධන වාර්තාව තුළ ඇතුළත් කළ යුතු වීම. |

**3.8 ප්‍රසම්පාදනයන්**

**----------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| ---------------------- | | ----------------------------------------- | ----------- |
| (අ) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පිළියෙල කර තිබූ ප්‍රසම්පාදන සැලැස්මේ, එක් එක් ප්‍රසම්පාදනයන් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත නිශ්චිත කාලවකවානු හඳුනාගෙන නොතිබූ අතර ඒ වෙනුවට “ඉදිරි වර්ෂය තුළ” යන්න සටහන් කිරීම පමණක් සිදු කර තිබුණි | 2020 වර්ෂයේ දි ප්‍රධාන ඉදිකිරීම් ව්‍යාපෘති කිසිවක් සඳහා ප්‍රසම්පාදන කටයුතු සිදු නොකළ නිසා ප්‍රසම්පාදන සැලැස්මේ ආරම්භ කිරීමට නියමිත දින සහ අවසන් කිරීමට නියමිත දින ඉදිරිපත් කර නොමැති බව දන්වන අතර ඉදිරි කාලයේ සිදු කරන ප්‍රසම්පාදනයන් ඒ අනුව සිදු කිරීමට පියවර ගන්නා බව . | ප්‍රසම්පාදන සැලැස්ම තුල කාලවකවානුවන් නිශ්චිතව දැක්විය යුතු වීම. |
| (ආ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1(ඇ) මාර්ගෝපදේශය පරිදි ප්‍රසම්පාදන කටයුතු විස්තරාත්මකව පිළියෙල කර නොතිබුණි. | පිළිගනිමි. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශිය ලේකම් කාර්යාලය 20 යන ගිණුම් ඒකක 21 සඳහා මුලධන වැය විෂයන් යටතේ සැලසෙන ප්‍රතිපාදනය සීමිත විම නිසා විස්තරාත්මක ප්‍රසම්පාදන කටයුතු දක්වා නොමැති බව. | ප්‍රසම්පාදන කටයුතු විස්තරාත්මකව පිළියෙල කළ යුතු වීම. |
| (ඇ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1(ඉ) මාර්ගෝපදේශය ප්‍රකාරව මාස 06 කට වැඩි නොවන කාලයක් තුළදි ප්‍රසම්පාදන සැලැස්ම නිතිපතා යාවත්කාලීන කළයුතු වුවද, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශිය ලේකම් කාර්යාල 05 ක් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | විගණනයෙන් පෙන්වා දි ඇති ආකාරයට මින් ඉදිරියට අවශ්‍ය අවස්ථාවලදි ප්‍රසම්පාදන සැලැස්ම සංශෝධනය කිරිමට පියවර ගන්නා බව. | යම් වෙනසක් සිදුවන්නේ නම් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන අනුව කටයුතු කළ යුතු වීම. |
| (ඈ) | පවිත්‍රතා සේවය සැපයීමට අදාළ ලංසු ආරාධනාවේ ලංසු කොන්දේසිවලට අනුව ව්‍යාපාර නාම ලියාපදිංචි සහතිකය, දැනට ශුද්ධ පවිත්‍ර කටයුතු ඉටු කරනු ලබන | එකඟ වන බව හා 2021 වර්ෂයේ ආරාධනා කරන ලද ලංසු අතරින් සාර්ථක ලංසුකරු තෝරා ගැනීමේදී පෙන්වා දී ඇති ලියාපදිංචි වර්ෂ ගණන හා පළපුරුද්ද සැලකිල්ලට ගෙන තාක්ෂණ ඇගැයීම් ක්‍රියාවලියකින් ලංසු ප්‍රදානයන් සිදුකර ඇති | ලංසු ආරාධනාවේ දි දක්වන ලද ලංසු කොන්දේසින්, තාක්ෂණික ඇගැයීම් කමිටුව හා ප්‍රසම්පාදන කමිටුව තීරණ ගැනිමේදී සලකා බැලිය යුතු විම. |

| | | |
|---|---|---|
| ආයතන පිළිබඳ තොරතුරු කැඳවා තිබුණි. ලංසු සලකා බැලීමේදී එම අවශ්‍යතාවයන් තාක්ෂණික ඇගැයීම් කමිටුවේදී හෝ ප්‍රසම්පාදන කමිටු තීරණයේදී සලකා බලා නොතිබුණි. ලංසු ඉදිරිපත් කර තිබූ ආයතන 12 න් මාස 5 ක් වැනි කෙටි කාලයක ලියාපදිංචියක් ඇති හා සේවා පළපුරුද්ද පිළිබඳ කිසිදු තොරතුරක් ඉදිරිපත් කර නොතිබූ ආයතනයකට සමාලෝචිත වර්ෂයේ දිස්ත්‍රික් ලේකම් කාර්යාල පරිශ්‍රය, ශ්‍රවනාගාරය, කටුගස්තොට පුහුණු සේවා ආයතනය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 15 ක පවිත්‍රතා සේවය සැපයීමට අදාළ ලංසුව ප්‍රදානය කර තිබුණි. | බවත් විගණනයෙන් පෙන්වා දී ඇති ආකාරයේ අඩුපාඩු වලින් තොරව ඇගැයීම් ක්‍රියාවලිය සහ ප්‍රදානය කිරිම ඇතුළු ප්‍රසම්පාදන ක්‍රියාවලිය සිදු කිරීමට පියවර ගන්නා බව. | |

## 3.9 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) වර්තමානය වනවිට ගහවට කෝරළේ ප්‍රාදේශීය ලේකම් නිල නිවස ලෙස පරිහරණය කරමින් පවතින ගොඩනැඟිල්ල පිටුපස, නිල නිවසට අයත් නොවන 27'×55' වපසරියකින් යුත් කුඩා ගොඩනැඟිල්ලක් සහිත භූමි කොටසක් පැවතුණද එම ගොඩනැඟිල්ල ඵලදායී පරිහරණයක් සඳහා යොදා නොගෙන දිරාපත් වෙමින් පැවතුණි. | නිල නිවසට අයත් නොවන 27’*55’ වපසරියකින් යුත් කුඩා ගොඩනැගිල්ලක් සහිත භූමි කොටස පෙර මූරකරුගේ භාවිතයට ගෙන තිබූ බවත් කාර්යාලයේ ගබඩා පහසුකම් නොමැති බැවින් ඉදිරියේ දී පවිත්‍ර කර එය ගබඩාව සඳහා යොදා ගැනීමට කටයුතු යොදා ඇති බව . | වත්කම් ඵලදායි ලෙස උපයෝජනය කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සතු රජයේ නිවාස 04 ක් වර්ෂ 2 ත් වර්ෂ 8 ත් අතර කාලයක් අබලන් වීම හේතුවෙන් භාවිතයට ගත නොහැකිව පැවතුනි. එම නිවාස අළුත්වැඩියා කර භාවිතයට ගත හැකි තත්ත්වයට පත්කර නිලධාරීන්ට ලබාදීම කෙරෙහි ප්‍රමාණවත් අවධානය යොමු කර නොතිබුණි. | අලුත් වැඩියා කටයුතු සිදුකිරීමට සැලැසුම් කළද, අවශ්‍ය පරිදි ප්‍රතිපාදන නොලැබීම මත අලුත්වැඩියා කටයුතු සිදුකිරීමට නොහැකිවූ බව . | නිවාස අලුත්වැඩියා කර ඵලදායී ලෙස උපයෝජනය කළ යුතු වීම. |

**3.10 පාඩු හා හානි**

--------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ----------------------- | ------------------------------ | ------------ |
| (අ) | 2008 නොවැම්බර් 18 දින සිදුව තිබූ ගහඉහළ කෝරළේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් කැබ් රථයේ අනතුරට අදාළ මුළු අලාභයෙන් අයනොකළ සියයට 50 ක් එනම් රු.144,174 ක් රජයට සිදුව ඇති පාඩුවක් වුවද, මූල්‍ය ප්‍රකාශනයේ පාඩු හා අත් හැරීම් පිළිබඳ ප්‍රකාශයේ සටහන (i) යටතේ ඇතුළත් කර නොතිබුණි. | මෙම වාහන අනතුර හේතුවෙන් රජයට සිදුවී ඇති රු. 144,174/- ක අලාභය මූල්‍ය ප්‍රකාශනයේ පාඩු හා අත්හැරීම් පිළිබඳ සටහන 1 යටතේ ඇතුළත් කළ යුතු බව පිළිගන්නා අතර, එය ප්‍රමාද දෝශයකින් ඇතුළත්වී නොමැති බව . | අදාළ සියලුම තොරතුරු මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත් කළ යුතු වීම. |
| (ආ) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් අප්ලන්ඩ්ස්වල පිහිටි අංක 250/8 රජයේ නිවාසයේ 2018 ජූනි 28 දින සිදුව ඇති සොරකම සම්බන්ධව අලාභය තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර නොතිබුණි. | විගණනයෙන් පෙන්වාදී ඇති රජයේ නිලනිවාසයේ සිදුව ඇති සොරකම සම්බන්ධයෙන් පරික්ෂණ පවත්වා තක්සේරුකර ඉදිරි මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කිරීමට කටයුතු කරන බව. | -එම- |
| (ඇ) | උඩපළාත ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ 2017 මැයි මස 25 වන දින අනතුරට පත් වූ නිල කැබ් රථයේ ඇස්තමේන්තු කළ මුළු අලාභ වටිනාකම වූ රු.2,223,927 කින් තවදුරටත් අයවිය යුතුව ඇති රු.210,093 ක මුදල රියදුරුගෙන් අයකර ගැනීම සම්බන්ධයෙන් | අනතුරට වගකිව යුතු රියදුරු මියගොස් ඇති බව හා ඔහුගේ නීත්‍යානුකූල උරුමකාරිය සම්බන්ධ තොරතුරු උඩ පළාත ප්‍රාදේශීය ලේකම් විසින් අංක KDS/UDP/1/1/VEH/9 හා 2021.03.13 දිනැති ලිපියෙන් නීතිපති වෙත දන්වා යවා තිබූ බව. | අලාභහානි වගකිවයුතු පාර්ශවයන් වෙතින් අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. |

නීතිපතිවරයා වෙත 2019 ජනවාරි මාසයේදී යොමුකර තිබුණ නමුත් 2021 අප්‍රේල් මාසය වන විටත් එම අලාභ මුදල අය කරගෙන නොතිබුණි.

### 3.11 අනාර්ජික ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2019 නොවැම්බර් 22 දිනැති අංක BD/GPS/130/9/4/MC-8 දරන ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂගේ ලිපියේ 2 ඡේදයෙන් එක් නිලධාරියෙකුට එක් යතුරු පැදියක් පමණක් හිමිවන බව දක්වා තිබුණද 2014 අයවැය යෝජනා අනුව සහනදායී පදනමට යතුරුපැදි ලබාගත් ක්ෂේත්‍ර නිලධාරීන් 07 දෙනෙකුට මහනුවර දිස්ත්‍රික්කයේ පළාත් පාලන ආයතන සඳහා තේරී පත් වූ මහජන නියෝජිතයින්ට සහන පදනමට ලබාදුන් යතුරුපැදිද ලබාගෙන ඇතත් ඔවුන්ගෙන් එක් යතුරුපැදියක වෙළඳපල වටිනාකම අයකරගෙන නොතිබුණි. | ඉහත කාරණයට අදාළ නිලධාරින් 07 දෙනා සඳහා තමන් විසින් ලබාගත් යතුරුපැදියේ වෙළඳපළ වටිනාකම 2021.05.20 දිනට පෙර දිස්ත්‍රික් සමෘද්ධි අංශය වෙත ගෙවා බිල්පත් ඉදිරිපත් කරන ලෙසත්, එලෙස ගෙවීමට අසමත් වන්නේ නම් එම මුදල වාරික ලෙස වැටුපෙන් අයකර ගැනීමට කරනු ලබන බවත්, ලිඛිතව දන්වා යවන ලද බව . | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළයුතු වීම. |

### 3.12 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂයේ පවිත්‍රතා සේවාව සැපයීම සඳහා තෝරාගත් ආයතනයට මිනිස්දින 383 ක් සේවය සපයා නොතිබියදී ගිවිසුම් ප්‍රකාරව මාසිකව රු.355,553 බැගින් ගෙවීම් කර තිබුණි. ඒ අනුව ගිවිසුම් ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් සේවක අර්ථසාධක අරමුදල් දායකය ලෙස රු.62,196 ක් බැගින්ද සේවා නියුක්තියන්ගේ භාර අරමුදල වෙත රු.15,549 ක් බැගින්ද පවිත්‍රතා ආයතනය වෙත මාසිකව සිදුකර ඇතත් පවිත්‍රතා ආයතනය විසින් සේවක අර්ථසාධක අරමුදල් සඳහා රු.234,643 ක මුදලක් අඩුවෙන් ප්‍රේෂණය කර තිබුණි. | විගණනයෙන් පෙන්වා දී ඇති කරුණු පිළිගන්නා බවත්, පවිත්‍රතා සේවාවට යොදවා ඇති සේවකයින්ට සේවක අර්ථසාධක අරමුදල් සහ සේවක භාරකාර අරමුදල් දායකත්වයන් ලැබෙන්නේ ද යන්න සොයා බැලීමට පියවර ගන්නා බව. | ගෙවීම් සම්බන්ධයෙන් පසුවිපරම් සිදු කිරිම කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ගහවට කෝරළේ ප්‍රාදේශීය ලේකම්වරයාගේ නිල නිවාසය ලෙස වර්තමානය වන විට භාවිතා කරමින් පවතින අරුප්පල දේවාලවත්ත අංක 27/4 හි පිහිටි ඉඩමේ අයිතිය විධිමත්ව පවරාගෙන නොතිබුණි. පරිත්‍යාගයක් ලෙස ලද මෙම ඉඩම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත පවරා ගැනීමට කටයුතු කිරීමේ ප්‍රමාදය හේතුවෙන් වර්ෂ 4 ½ ක් ඉකුත් වීත් එය අත්පත් කර ගැනීමට නොහැකි වී තිබුණි. | මෙම ඉඩම විධිමත්ව පවරා ගැනීම සඳහා තක්සේරු දෙපාර්තමේන්තුව වෙතින් තක්සේරු වාර්තාවක් කැඳවා තිබූ බවත්, 2021.04.30 දිනට එම වාර්තාව ලබා දෙන බවට තක්සේරු දෙපාර්තමේන්තුව එකඟ වී සිටිය ද එහි නිලධාරියෙකුට කෝවිඩ් - 19 වැළඳීම මත එය ප්‍රමාදවිය. 2021.05.17 ඇරඹෙන සතිය තුළ මෙම තක්සේරු වාර්තාව ලබාගෙන ඉදිරි කටයුතු කිරීමට සැළසුම් කර ඇති බව. | ආයතන තම වත්කම් පවරා ගැනීමට කටයුතු කල යුතු වීම. |
| (ඇ) | ගහවට කෝරළේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් සමාලෝචිත වර්ෂයේ රු.7,722,000 ක බිල්පත් වටිනාකමක් ඇති පැති බැමි හා පැති කාණු ඉදි කළ ව්‍යාපෘති 07 ක් වෙනුවෙන් රසායනාගාර පරීක්ෂණ (Lab Test) වාර්තා ලබාගෙන නොතිබුණි | මේ සම්බන්ධව ප්‍රධාන ඉංජිනේරු උපදෙස් ලබාගෙන කටයුතු කිරීමට සටහන් කරගත් බව දන්වමි. | පැති බැමි හා පැති කාණු සම්බන්ධයෙන් රසායනාගාර පරීක්ෂණ (Lab Test) වාර්තා ලබා ගත යුතු වීම. |
| (ඈ) | නියැදි පරීක්ෂාවේදී ප්‍රාදේශීය ලේකම් කාර්යාල 02 ක අවස්ථා 36 කදී ඉඩම් අත්පත් කර ගැනීම් සම්බන්ධයෙන්, වර්ෂ 3 ත් වර්ෂ 25 ත් අතර පරාසයක කාල ප්‍රමාදයක් පැවති අතර, ඒ හේතුවෙන් ඉඩම් අත්පත් කර ගැනීමෙන් පසු බලාපොරොත්තු වූ අරමුණු ඉටුකර ගැනීමට නොහැකී වී තිබුණි | ඉඩම් අත්පත් කටයුතුවලදී රාජ්‍ය ආයතන රාශියක් ඒ සඳහා සම්බන්ධ වන අතර, එම කටයුතු සිදුවීමේදී (මිනින්දෝරු, තක්සේරු, වන සංරක්ෂණ, ඉඩම් අමාත්‍යාංශය, පරිසර අමා.) ඒ සඳහා කාලයක්ගත වන බවත්, මුල් හිමිකරුවන් ජීවතුන් අතර නොසිටීම වැනි කරුණු මත ඉඩම් වල මායිම් පෙන්වා දීමට කිසිවෙකු නොදැන සිටීම නිසා මැනුම් කටයුතු සිදුකිරීම<br><br>මෙන්ම තක්සේරු කටයුතු සිදුකිරීම අපහසුවී ඇති බවත්, ඉඩම්වල හිමිකරුවන් මෙම කටයුතුවලට සම්බන්ධ කරගැනීම සඳහා මේ වන විට පදිංචි ස්ථාන සොයාගත නොහැකිවීමද ප්‍රමාදවීම් වලට හේතු වී ඇති බව . | ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු කඩිනමින් කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය විසින් 2017 ජුනි 20 දිනැතිව නිකුත් කරන ලද අංක 04/2017 චක්‍රලේඛයෙහි 5 වන ඡේදයට අනුව සෑම වර්ෂයක් අවසානයේදීම දෙසැම්බර් 31 දිනට ලැබුණු හා නිකුත් කරන ලද පෝෂණ වවුචර්පත්‍රවල නිරවද්‍යතාවය කමිටුවක් විසින් ගණනය කර විනාශ කළ යුතු විය. එහෙත් මේ වන විට 2017 වර්ෂය සඳහා පමණක් කමිටුවක් පත් කර එමගින් 2015 හා 2016 වර්ෂයේ කූපන්පත්වලට අදාළ ගණනය කිරීම් කර 2020 වර්ෂයේ මැයි හා ජුනි මාසයන් තුළ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 08 ක පමණක් විනාශ කර තිබූ අතර පෝෂණ වවුචර් විනාශ කිරීම සඳහා කමිටු පත් කිරීමක් හෝ මේ දක්වා සිදු කර නොතිබුණි. | 2015 වර්ෂයේ මෙම වැඩ සටහන ආරම්භ වූ අතර , චක්‍රලේඛයේ පරිදි ලේඛන විනාශ කිරීමට වසර 5 ක් සම්පූර්ණ විය යුතු බවත්, ඒ අනුව 2020/03/02 වන දිනැති 4/2017- (1) චක්‍රලේඛ උපදෙස් ප්‍රකාර නැවත වාර්තා සකස් කිරීම ආරම්භ කරන ලද බවත් , ඒ අනුව 2021/01/15 වන දින ළමා ලේකම් කාර්යාලයෙන් ලද ලිපිය අනුව ප්‍රදේශීය ලේකම් කාර්යාල විසින් කූපන්පත් හා වවුචර්පත් විනාශ කිරීම ආරම්භ කළ බවත්, මේ වන විට ප්‍රාදේශීය ලේකම් කාර්යාල 8 ක් එය අවසන් කර ඇති බවත්, අනෙකුත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් මේ වන විට කමිටු අනුමැතියෙන් එය සිදුකිරීමට කටයුතු කරමින් සිටින බව. | චක්‍රලේඛ විධිවිධාන අනුව කටයුතු කළයුතු වීම |

## 4. තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සමස්ත ආයතනයක් ලෙස සැළකිමේදී නිශ්චිතව තීරණය කරනු ලැබූ තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්කයන් හඳුනාගෙන නොතිබුණි. | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ විවිධ අරමුණු හා ඉලක්ක ඇති ආයතන ඒකරාශිව මහනුවර දිස්ත්‍රික්කය ශ්‍රී ලංකාවේ විශිෂ්ඨතම පරිපාලන ආයතනයක් ලෙස තිරසර සංවර්ධනය කරාගෙනයාම සඳහා එක් එක් අංශ යටතේ තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්කයන් වෙනම හඳුනාගෙන ක්‍රියාකාරී සැලස්ම හා කාර්යසාධන වාර්තාව සකස් කර ඇති බව. | සමස්තයක් වශයෙන් පරමාර්ථ ඉටු කර ගැනීමට හැකිවන ආකාරයට තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්කයන් තීරණය කළ යුතු වීම. |

## 5. යහපාලනය

## 5.1 මහජනයා වෙත සේවා ඉටු කිරිම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| බහුකාර්ය සංවර්ධන කාර්යසාධක බලකාය මඟින් අඩු ආදායම්ලාභීන් වෙත රැකියා ලබාදීමේ වැඩ සටහන යටතේ ස්වදේශ කටයුතු අමාත්‍යාංශ ලේකම්ගේ 2020 පෙබරවාරි 20 දිනැති අංක 06/2020 චක්‍රලේඛය ප්‍රකාරව අඩු ආදායම්ලාභීන් 100000 ක් වෙත රැකියා ලබාදීමේදී හාරිස්පත්තුව ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ ග්‍රාම නිලධාරි වසම් 40 ක සුදුසුකම් සපුරා තිබූ අයදුම්කරුවන් අනුපිළිවෙල නොසලකා අයදුම්කරුවන් 132 දෙනෙකු වෙත පත්වීම් ලබාදී තිබුණි. | 2020 ජනවාරි 21 දිනැති අංක PS/GPA/Circular/04/2020 දරන චක්‍රලේඛය හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්ගේ 2020.01.21 දිනැති අංක HA/05/04 හා 2020.06.18 දිනැති ලිපි ප්‍රකාරව සුදුසුකම් සපුරා ඇති අයදුම් කරුවන් 573 දෙනෙකු ඇතුළත්කර පොතක් ලෙස සකසා ඇත. එන මුල්ම පිටුවේ සාරාංශයක් ඇතුළත්කර බහුකාර්ය සංවර්ධන කාර්යසාධක බලකා දෙපාර්තමේන්තුවට ලබාදීමට දන්වා ඇති පරිදි කටයුතු කරන ලද බව සහ අයදුම්කරුවන් 132 ක් වෙත පත්වීම් ලිපි ලබාදීම සම්බන්ධව කටයුතුකර ඇත්තේ බහුකාර්ය සංවර්ධන කාර්යසාධක බලකා දෙපාර්තමේන්තුව බව . | ස්වදේශ කටයුතු අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

## 6. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) 2020 දෙසැම්බර් 31 දිනට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ තනතුරු 08 ක පුරප්පාඩු 09 ක්ද ප්‍රාදේශීය ලේකම් කාර්යාල 20 හි පුරප්පාඩු 333 ක් ද වශයෙන් පුරප්පාඩු 342 ක් පැවතුණි. | නිලධාරින්ගේ ස්ථාන මාරුවී යාම, විශ්‍රාම යාම, මියයාම ආදිය හේතුවෙන් තනතුරු පුරප්පාඩු වී ඇති අතර, ඒ පිළිබඳව වන විස්තර වාර්තා ත්‍රෛමාසිකව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කරනු ලබන බවත්, රාජ්‍ය පරිපාලන, පළාත් පාලන අමාත්‍යාංශ විසින් සිදුකරනු ලබන බඳවාගැනීම් අනුව එම පුරප්පාඩු පිරවීම සිදුකරනු ලබන බව. | යහපත් සේවාවක් පවත්වාගෙන යාම සඳහා පුරප්පාඩු සම්පූර්ණ කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2020 දෙසැම්බර් 31 දිනට මහනුවර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 20 හි අනුමත ග්‍රාම නිලධාරී සංඛ්‍යාව 1187 ක් වුවද, ග්‍රාම නිලධාරී තනතුරු 141 ක පුරප්පාඩු පැවතුණි. | මහනුවර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා ග්‍රාම නිලධාරින් බඳවා ගැනීමේ තරඟ විභාගයේ ප්‍රතිඵල මත ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය වෙතින් සිදු කරනු ඇති බව. | යහපත් සේවාවක් පවත්වාගෙන යාම සඳහා පුරප්පාඩු සම්පූර්ණ කළ යුතු වීම. |
| (ඇ) | ගඟවට කෝරළේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ අනුමත අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් තනතුරක් පමණක් පැවතියද එම කාර්යාලයේ නිලධාරීන් දෙදෙනෙකුද, අනුමත තාක්ෂණ නිලධාරීන් සංඛ්‍යාව 02 ක් වුවද තුන්දෙනෙකු ද සේවය කරනු ලැබේ. | 2015 වර්ෂයේ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයට පැවරී තිබූ රාජකාරී ප්‍රාදේශීය ලේකම් වෙත පැවරීමත්, 2014 වර්ෂයේ මහනුවර දිස්ත්‍රික්කයටම අදාළ උප්පැන්න විවාහ සහතික නිකුත් කිරීම මාර්ගගත (Online) ක්‍රමයට ලබාදීමේ වැඩපිළිවෙල හේතුවෙන් නාගරික කාර්යාලයක් වන මෙම කාර්යාලයේ රාජකාරී බහුල වීම මත අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් නිලධාරීන් දෙදෙනෙක් දෙපාර්තමේන්තුවෙන් අනුයුක්ත කර ඇති බවත්, මෙම කොට්ඨාසයේ මැතිවරණ කොට්ඨාස දෙකක් පවතින බැවින් සේවා අවශ්‍යතාවය පදනම් කර ගනිමින් තාක්ෂණ නිලධාරීන් දෙදෙනාට අමතරව එක් නිලධාරියෙකු අනුයුක්ත කර ඇති බවත් . | අතිරික්ත තනතුරු අනුමත කරගැනීමට හෝ අතිරික්ත කාර්යමණ්ඩල ස්ථාන මාරු කර යැවීමට කටයුතු කළ යුතු වීම. |